දුරකථන) 0112669192 , 0112675011
தொலைபேசி) 0112694033 , 0112675280
Telephone) 0112675449

ෆැක්ස්) 0112693866
பெக்ஸ்) 0112693869
Fax) 0112692913

විද්‍යුත් තැපෑල) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி)
e-mail)

වෙබ් අඩවිය) www.health.gov.lk
இணையத்தளம்)
website)



සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය) NA/05/Annual/01/2026
எனது இல)
My No.)

ඔබේ අංකය)
உமது இல)
Your No.)

දිනය) 2026.11.
திகதி)
Date)

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික රෝහල/ ජාතික රෝහල මහනුවර / ජාතික රෝහල ගාල්ල
රේඛීය අමාත්‍යාංශයට අයත් සියලුම ශික්ෂණ රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල්, මහ රෝහල් සහ මූලික රෝහල් අධ්‍යක්ෂවරු ඇතුළු සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්

<u>හෙද/ හෙදි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2026</u>

හෙද/ හෙදි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු ලබා දීමට අදාළව නිකුත් කරන ලද අංක 01-23/2026 හා 2026.04.20 දිනැති ස්ථානමාරු චක්‍රලේඛය හා මගේ සමාංක හා 2026.09.18 දිනැති අභියාචනා කැඳවීමේ ලිපිය හා බැඳේ. ඒ අනුව **2026** වාර්ෂික ස්ථානමාරු නියෝග සඳහා අනුමැතිය මෙයින් ලබා දෙමි.

02. **2020** සිසු හෙද කණ්ඩායම සඳහා **2026.11.12** දින සිට ක්‍රියාත්මක වන පරිදි **III** ශ්‍රේණියේ හෙද නිලධාරී පත්වීම් ලබා දී වාර්ෂික ස්ථානමාරු නියෝග ලද හෙද/ හෙදි නිලධාරීන්ගේ අනුප්‍රාප්තිකයින් ලෙස සහ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා, රේඛීය අමාත්‍යාංශයේ රෝහල් සහ සෞඛ්‍ය ආයතන, පළාත් සභා වෙත අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.

03. ඒ අනුව, ස්ථානමාරු ලේඛනයේ නිර්දේශය යන තීරුව යටතේ **"නිර්දේශ කරමු"** ලෙස සඳහන් කර ඇති නිලධාරීන්, ස්ථානමාරු නියෝගය තීරුවේ දක්වා ඇති රෝහල / සෞඛ්‍ය ආයතනය වෙත ස්ථානමාරු බලාත්මක වන දින සිට ද, **"පළාත් අනුමැතියට යටත්ව නිර්දේශ කරමු"** යනුවෙන් සඳහන් නිලධාරීන් ඔවුන් ස්ථාන මාරු ලැබ ඇති රෝහල / සෞඛ්‍ය ආයතනය අයත් පළාත් සභාවේ අනුමැතිය ලද පසු ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති **257** හි දක්වා ඇති අන්දමට ස්ථානමාරුව සඳහා නිදහස් කිරීමට අනිවාර්යයෙන් කටයුතු කළ යුතු වේ.

04. එසේ ක්‍රියා නොකරන ආයතන / රෝහල් ප්‍රධානීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **II** කාණ්ඩයේ රාජ්‍ය නිලධාරයන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උප ලේඛනයේ **14** වන වගන්තියට අනුව සිදු කරනු ලබන වරදක් ලෙස සලකා විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

05. එසේම, මෙතෙක් බලාත්මකව පැවති **2024** වාර්ෂික ස්ථානමාරු නියෝග සියල්ල අවලංගු කරන අතර, මෙතැන් සිට ක්‍රියාත්මක වන්නේ **2026** වාර්ෂික ස්ථානමාරු ලේඛනයේ ඇතුලත් නියෝග පමණි.

06. මෙම ලැයිස්තුවේ ඇතුළත් සේවා කාලයන් පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලද්දේ අදාළ නිලධාරීන්ගේ ස්ථානමාරු අයදුම්පත්වලින් වන බැවින් එම අයදුම්පත්වල සඳහන් තොරතුරු ව්‍යාජ හෝ අසත්‍ය බවට

හෙළිදරව් වුවහොත් එම තොරතුරු සපයන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන බව දන්වා සිටින අතර, එවැනි වැරදි තොරතුරු මත ලබා දෙන ස්ථානමාරු නියෝගයන් ද අවලංගු කෙරේ. එසේම එවැනි වැරදි තොරතුරු ඇතුළත් ස්ථානමාරු අයදුම්පත් සහතික කරන ලද නිලධාරීන් ද ඒ සඳහා වගකිවයුතු වේ.

07. වාර්ෂික ස්ථානමාරු සඳහා අභියාචනා කැඳවීමේ දී ස්ථානමාරු අවලංගු කරගැනීම සඳහා ඉඩකඩ සලසා තිබූ බැවින්, අවසන් ස්ථානමාරු ලේඛනයේ සඳහන් කිසිදු ස්ථානමාරුවක් අවලංගු කිරීමට අවස්ථාවක් ලබා දෙනු නොලැබේ. එසේම එම ඉල්ලීම් පෞද්ගලිකව හෝ ආයතන ප්‍රධානී මගින් ඉදිරිපත් කිරීමට කටයුතු නොකරන ලෙස අදාළ හෙද නිලධාරීන් දැනුවත් කරන මෙන් දන්වමි.

08. අවසන් ස්ථානමාරු නියෝගය ඇතුළත් ලේඛනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි **(www.health.gov.lk)** පළ කර ඇති අතර, එම නියෝග පෞද්ගලිකව කිසිදු නිලධාරියෙකු වෙත දැනුම් දෙනු නොලැබේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ/ රෝහලේ අදාළ සියලුම හෙද/ හෙදි නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

09. මෙම ස්ථානමාරු නියෝග **2026.11.23** දින සිට බලාත්මක වේ.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

දුරකථන) 0112669192 , 0112675011
தொலைபேசி) 0112694033 , 0112675280
Telephone) 0112675449

ෆැක්ස්) 0112693866
பெக்ஸ்) 0112693869
Fax) 0112692913

විද්‍යුත් තැපෑල) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி)
e-mail)

වෙබ් අඩවිය) www.health.gov.lk
இணையத்தளம்)
website)



සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය) NA/05/Annual/01/2026
எனது இல)
My No.)

ඔබේ අංකය)
உமது இல)
Your No.)

දිනය) 11.2026
திகதி)
Date)

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media

Director, The National Hospital of Sri Lanka / National Hospital Kandy / National Hospital Galle
All Directors of Teaching Hospitals, District General Hospitals, General Hospitals, Base Hospitals, and Heads of all other Health Institutions under the Line Ministry

Annual Transfers of Nursing Officers - 2026

With reference to the Transfer Circular bearing No. 01/23-2026 dated 20.04.2026 issued in relation to the Annual Transfers of Nursing Officers 2026, and my letter bearing No. and dated 18.09.2026 calling for appeals, approval is hereby granted for the Annual Transfer Orders for the year 2026.

02. With effect from 12.11.2026, appointments to Grade III of the Nursing Officer Service have been granted to the 2020 Student Nursing Batch. Accordingly, arrangements have been made to attach these newly appointed Nursing Officers to Line Ministry Hospitals and Health Institutions, as well as Provincial Councils, to serve as replacements for Nursing Officers who have received annual transfer orders and also to fill the existing vacancies.

03. Accordingly, officers whose names appear under the column titled "Recommendation" in the Transfer List with the remark "Recommended" shall be released for transfer to the Hospital /Institution indicated in the column titled "Transfer Order", with effect from the date on which the transfer orders become effective. Officers whose names appear with the remark "Recommended subject to Provincial Council Approval" shall be released for transfer only after obtaining the approval of the respective Provincial Council to which the hospital/ health institution to which they have been transferred belongs. All relevant Heads of Institutions are required to take necessary action to release such officers for transfer in accordance with Rule 257 of the Procedural Rules of the Public Service Commission.

04. In the event of failure to comply with the above instructions, disciplinary action will be initiated against the Heads of the relevant Institutions/Hospitals, considering such failure as an offence under Section 14 of the First Schedule relating to offences that may be committed by public officers, as specified in Volume II of the Establishments Code.

05. Furthermore, all Annual Transfer Orders for the year 2024, which have remained in force up to now, are hereby cancelled. Henceforth, only the transfer orders included in the Annual Transfer List for the year 2026 shall be implemented.

06. The information relating to the periods of service included in this list has been obtained from the transfer applications submitted by the respective officers. Therefore, please be informed that disciplinary action will be taken against officers who have provided such information if any of the particulars furnished in their applications are found to be false or fraudulent. Furthermore, any transfer orders issued on the basis of such false information will also be cancelled. The officers who have certified transfer applications containing such false or inaccurate information shall also be held responsible in this regard.

07. Since an opportunity was provided to request the cancellation of transfers during the appeal process for annual transfers, no requests will be entertained to cancel any transfer mentioned in the final transfer list. Furthermore, the relevant nursing officers should be informed not to submit such requests either personally or through their respective Heads of Institutions.

08. The final list containing the Annual Transfer Orders has been published on the official website www.health.gov.lk of the Ministry of Health and Mass Media. Individual notifications of these transfer orders will not be issued to the respective officers. Accordingly, please take necessary action to inform all relevant Nursing Officers serving at your Institution/ Hospital regarding these transfer orders.

09. These Annual Transfer Orders shall come into effect from 23.11.2026.

Dr. Anil Jasinghe
Secretary
Ministry of Health and Mass Media

Dr. Anil Jasinghe
Secretary
Ministry of Health & Mass Media
"Suwasiripaya"
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha
Colombo 10